# ලන්ඩන් කවි
# LONDON KAVI

1 st Floor, 2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 8348 7772, Fax: 020 7976 1667, Email: kavi@londonkavi.com
Free Circulation - **Issue 10 October - November 2008**


## කටහඬ

සොඳුරු සැඳෑවකි
ඒත්
පාළුව රජ කරන

අතට ගෙන පොතක්
කියවාගෙන යමි

“අම්මේ! අම්මේ!”
ඇසුණි මට කටහඬක්
අසල්වැසි නිවසකින්
පොඩි පුතෙක් ගෙදර විත්
මෑණියට අඬගසන

ඔසවා හිස බැලුවෙමි මම
ඒ ඔබදැයි කියා
සිහි නොවීය මගෙ පොඩිපුතු
දුරු කතරක කියා


යළිත් වරක් දෑස් තෙමා
කියවාගෙන යන්නෙමි මම
විදු සක්විති නිමැවුම් රස
බුත්සරණය පුරා

මහාචාර්ය කුසුමා කරුණාරත්න

### කවි සෙනෙහස

ගව් දසදහසක් ඈතින් විසුවත්
මැකේ ද කවි සෙනෙහස කව දා
ලක් බිම සිහිනෙන්
දකිමින් සිඹිමින්
නිතියෙන් එහි යන එන සුහදා
මල් වරුවානනි නෙළනු මැනවි
කවි නෙළුම් විළේ ඉඟිබිඟි විහිදා
ලන්ඩන් කවි පිටු සරසමු සඳැසින්
නිසඳැසියෙන් සිතිවිලි පහදා

ඔබේ කවි මිළඟ කලාපය සඳහා
එවන්න ලන්ඩන් කවි LONDON KAVI
**London Kavi**
**1 st Floor, 2 Queens Parade**
**London N8 0RD**



බුදු සරණය දම් සරණය හුදු අපට
බඳ විදුලිය සැරසිලි වෙය වටින් වට
සිත මිදුනිය ලැබ සහනය විටින් විට
පින පිරුනිය වැඳ කැලණිය එක වරට

- අනුර

(ඡායාරූපය : ආරිය බණ්ඩාර සමරකෝන්)

### The Call

Pleasant indeed, the evening
But loneliness reigns
With book in hand
I sit to read

A voice, I hear
Mother! Mother!!
A house nearby
A son come home

I raise my head
To greet you son
Then I know
You are far away
Far far away my son

I turn the page
Of the book once more
With hope for bliss
In what I read

**Professor Kusuma Karunaratne**

### මඳක් නැවතී බලමි...!!

*ජීවිතය ගඟක් වගේ*
*පෙරදා ලක්මව් තුරුල්ලේ*
*නිදහසේ ගලා විත්*
*සයුරින් එතෙර වී*
*ලන්ඩනය හරහා ගලා හැලෙන*
*ජීවිතය ගඟක් වගේමයි...!*
*ගලා වැටෙද්දී ඒ ගඟ*
*පසුකරා නොයෙක් තැන්*
*බොහෝ දෙන ඒ ගඟින්*
*ගන්න තැනුවා දිය පොදක්!*
*නියං ආවා සුළි සුළං ආවා*
*ඉඳහිට ගං වතුර වී*
*හිත පිටාර ගැලුවා...*
*කඳුලක්ව..!*
*තව දුරයි ජීවිතය*
*නිම්නයක් ළඟ නවතින්න*
*හීන මැව්වත් තාම*
*තනිකඩයි මේ ගඟ!*

දර්ශනී මීගස්වත්ත ලන්ඩනය

# සපුමල් බණ්ඩාර කවි

## මගේ හුරු අත

ඔබ දකුණත ද
මම දකුණුත් වෙමි
ඔබ වමත් නම්
වම් අත ගැන සිතන්න.

නින්දේ අවදියෙන්
රෑ දිවා
ඔබ හුරු අත ගැන සිතන්න.

දහසක් වැඩ
නුහුරට නොකියා
තමාම කරනා
ඔබ හුරු අත ගැන සිතන්න.

කරනා කිසිවක් නොකියන
කිසිදා නොතැවෙන
ඔබ හුරු අත ගැන සිතන්න.

කටුක රැය පහන් කර
පාන්දර පායා එන
ඔබ අම්මා ගැන සිතන්න

## නොගැයුනු ගීතය

ඔබට කියන්නට මෙතුවක් කල් සිට
පෙරුම් පුරා සිත එකලු කරන්
එවකට කොඳුරා පවසන්නට නොම
අමතක වූ ඒ සොඳුරු වදන්.....

සිතුවිලි සයුරේ තනි වුන දූවක
මල් පිපිලා දැන් හරි අරුමන්
නෙලා තුරුලු කර නිමේෂයක් ලෙද
අමතක වූ ඒ සොඳුරු වදන්......

මුවින් කියන්නට දෙසවන පින් නෑ
අතපසු වීමකි එය අභිමන්
පසක් වුනත් එය දැසට පින් ඇත
අමතක වූ ඒ සොඳුරු වදන්......

ඔබට කියන්නට මෙතුවක් කල් සිට
පෙරුම් පුරා සිත එකලු කරන්
සවනට කොඳුරා පවසන්නට
අමතක වූ ඒ සොඳුරු වදන්
ගැයුමට සිත් වූ සොඳුරු වදන්
ඔබට ඇසෙනවද සොඳුරු වදන්

## මහා සයුරේ කුරිරුකම

මා මෙලොවට බිහි වූ
නිසංසල පරිසරය
මහ සයුර බිලිගත් බව
ම සිත දේංකාර දේ

මා ඇසට නොදුටුව ද
මහ විපත් සාගරය
කිසි දිනක නොමැකෙන
මතක සටහන් ගොඩකි.

කුඩා දරු මව්පියන්
නගන දුක් අදෝනා
මහ ගැඹුරු සාගරය
ගිලගත් සැටිය අරුමය.

මගේ රට මගේ දැය
සොහොයුරන් සොයුරියන්
මිතුරු මිතුරියන් සමඟ
පියවරුන් මව්වරුන්
දරු දැරියන් සමඟ
දිවියෙ අවසන් ගමන්
ගිය විදියෙ කුරිරුකම

ගැඹුරු මහ සයුර මැද
අතර මං වුණ විදිය
මැව් මැවී පෙනෙන විට
කඳුළු සලනාව විනා
කල යමක් නොමැති විය.

මගේ රට මගේ දැය
බොදු දහම පතල වුණ
බොදු සිරිත් වැළඳ ගත්
අවිහිංසක පිරිස
ජීවිතය නො සිතූ ලෙස
පුද කෙරුණේ ඇයි මෙලෙස
සිතන්නෙමි දෙමිනසින්
කඳුළු පිරි නෙත් දෙකින්
මතකයට නැගෙන
සැම දිනයකම

අමිතා හෙට්ටිගේ
ලන්ඩනයේ දී

## සුළං පොදක්

සුළං පොදක් ඇගේ හැපී
මා වටා එතී
ගොසින් වරක් එන්න ආසයි
ඇය වටා එතී

කීවද සුළඟට පැහැදිලි කරලා
උණුසුම කිමැයි කියා
සොයා දෙන්න බෑ ඇස් නැති
සුළඟට
අරුමය මෙයැයි කියා

එනමුදු සුළඟේ පසු කර යන
විට
ඇය වෙත ඇදෙනු මැනේ
මඳක් දුරින් හිඳ මා හමු වූ වග
ඇය වෙත කියනු මැනේ

## හිරු සඳු මම

සඳ පායන කල
බාදිය සඳහා
සත් සමුදුර ඔබ වනවානම්

හිරු පායන කල
හිරු ගමනේ යන
සූරිය කැන් මල වනවානම්

ලෝකය හමුවේ
අහස කරා නැඟ
ලොව නිදනා රැය
ඔබ හා අවදිව
ඔබගේ මම වෙන්නම්
හිරු සඳු

## මහ සමුදුරට ඇතුළු වෙමි

අප්‍රමාණ වූ
ස්කන්ධ දරාගෙන
පොළොව ඇති කරන
පිරිසිදු උල්පත
ගලා එකිනෙකට එක්ව සීරුවට
සලසන ගඟුලක්
මහ සමුදුර වෙත

ක්‍රීඩා පිටියකි පිරිමි ළදරුවෙකි
මහ පොළවක් ඇති
ක්ෂීර පතයක් වෙති
වයසින් මෝරා හඳුනාගත හැකි
අරුත පියා වෙයි පිරිමිකමට හිමි

# කවි සයුරින් දිය දෝතක්

## කවියාගේ මරණය

"ලොව ඇත්තේ යෑම් ඊමිය
නැවින් යන්ට බැරිය
නොගොස් එන්ට බැරිය"

එන්න යැයි කිවද ඉක්මනට
නොසිතුවෙමි ඔබ යයි කියා
මෙතරම්ම ඉක්මනට
"නොගොස් එන්න බැරිය" ය
කියයි ඇදුරිඳු
එන්න අනේ ඉක්මනට
එනවිට ගෙන එන්න
ඔබ
මට
නොකී
කවි

අගෝස්තු මස 12 වන දිනට
යෙදුණු මහඳුරිඳු සරච්චන්ද්‍රයන් ගේ
12 වන ගුණ සමරුව නිමිත්තෙනි.
ආරියවංශ රණවීර

## සටන

මොළ නෙළු එකෙක්
රාක්ක මොළවලින් පුරවා
පොත් ගුලක හිර වී
කාවන් සමඟ සටනක

මොළ ගසා කෑ එකෙක්
සේප්පු කාසිවලින් පුරවා
රිදී යතුරු කැරැල්ල
විල්ලුද කොට්ටය යට සඟවා
නොමැරෙන බේත් සොයන
සටනක
අනේ දෙවිදත් නොදිටි මොක්පුර
සුගතපාල ද සිල්වා

පැය දොළහක් ම
වැඩ කරලා
ගෙදර ආ පසුත්

ඔරලෝසුව තාම නිදි
"ඇයි කවුරු හරි මේකට
වයින් තියන්නැත්තේ?"

(දෙසැම්බර් කාලකණ්ණියා)
- ජනක මහබෙල්ලන

## මැයි දෙ වැනි දා

පෙර දා දිවා කල සිට
නුවර අහසෙහි බැබැලුණු
එ හැම කොඩිවැල් කැඩී
උදැසන කුණු ගොඩට එක්විණි

කුමන පාටින් යුතු වුව
එක ම සුළඟේ සැලුණු කොඩි
මිනිසුන් බැඳි සියලු කොඩි
කුණු බක්කිවල එකට සිරවිණි

වීදි දෙවනත් කොට
නැඟී සටන් පාඨයක පදයක්
පෙළපාළිවල ඇසුණු
අනෙක ඉල්ලීම් ඝෝෂයෙන්
ඉතිරි වූ එක ම එක
රැවු බිඳක්
මැයි දෙවැනි දා සූර්යෝදයට
වසත් සුළඟට ද අමතක විණි

ගොදුරු ලොබයෙන් උදැසන
කපුටන් නඟන කලකලය මැද
විසුළ කුණු කසළ මල
නො හැර අතු ගා දමා
ශුද්ධ කළ නුවර රජ මාවතක
පහන් කණුවක පැටලුණු
සිඟිති රතු රෙදි ඉරක්
හමන සුළඟින් එසවෙයි.

ගිරග - නන්දන වීරසිංහ

## මධු සළිනි මධු විත

බිඳුණු
හදවතකි
කැටපත

බිඳුණු
කැටපතකි
හදවත

පැරණි
පෙම්වත්
මුහුණු
බොරුවට
හිනාවෙන

මංජුල වෙඩිවර්ධන

## පඩි නැති පඩි දවස

පඩි නැති දාට නගරය
අකරුණාවන්තය
රොස් පරොස් බස් තෙපලන
අගහිඟ මැසිවිලි කියන
බුම්මාගත් බිරියකි
කන්කරච්චල වෙළෙඳහෙළ

සාර පලය අඹ දඹ ද තැඹිලි ද
බෝම මිලට පුම්බා කම්මුල් සිටින
පාර දිගට ආඩම්බර ඔප් වඩන

කුල් හවුස් දැක දැක ඩාදිය පෙරන
හාල් මල්ල ලැජ්ජාවෙන් බිම බලන

බෝගහ යට තැඹිලි කඩ
ගොඩි ගෙයක් මෙනි ශෝකොනක

අද මුදලට ~ හෙට ණයට
ණය දීමෙන් නැතිවේ
මුදලත් මිතුරන්
ආණ්ඩුවත්

ඉතින් කවදාවත්
කැලැන්ඩරවල නැති
පඩි දවසක් නො එනු ඇති

සිට්ටු දාන මිතුරෝ
අහක බලා ගෙන යත්
සාද සාමීචි ගැන
කිසිවක් මතක් නොකරත්

බැංකුවේ
කවුන්ටරයේ
වීදුරුව උඩ දිලිසේ
ඇස් දෙකක් අහිමි
කඳුළක්.

මධ්‍යම යාමය
රත්න ශ්‍රී විජයසිංහ

චන්දිම විතානආරච්චි
විශේෂාංගය

## ඊයේ අද සහ හෙට....!

ඔයාට මතකද
පෙරේදා
අපි
සුදු ඇඳුම් ඇඳගෙන
මල් ගොඩක් අරගෙන
ඇගේ
ගෙදර ගිය හැටි........?
ඊයේ
ඒ විදිහටම
ඔයා ගේ ගෙදරත්
කට්ටියම ආවා.......
ඔයා ගේ ඇස්වලින්
බේරුණු කඳුළුවල
සීතල
තාමත් මගේ ඔසරියේ
දැවටිලා තියෙනවා........
අද
ඕගොල්ලෝ සේරම
මගෙ ගෙදර ඇවිත්
කිසිම දෙයක් හිතාගන්න
බැරුව
මල් ගොඩක් මැද
සුදු ඇඳගෙන - මම තනියම.....
හෙටත්
නොවැරදීම අපි කට්ටියටම
කොහේ හෝ යන්න වෙනවා
ඒ බව සහතිකයි!
තව තවත් ගොඩක් අය
අපේ ලැයිස්තුවට
හෙට - අනිද්දට එක්වේවි.....
මේ යුද්ධය දිනපු දාට
අපේ කඳුළු වියළේවිද?
මේ ගින්දර නිවීයාද ??

චන්දිම විතානආරච්චි - ලන්ඩනය

ලන්ඩන් කවි

සංස්කාරක - අනුර හැගොඩ
**Editor -** Anura Hegoda

වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය
**Web Design** - Kasun Palansuriya

# කැස්බෑ අම්මාගේ කවිය

සංවේගදායක පුවත: හබරාදූව වෙරළට ආ කැස්බෑ මවක් පණපිටින් සිටියදී ඇගේ කකුලක් කපාගෙන කති.

බුදුසරණින් මං ආවේ ලොවින් උතුම්රට දකින්ට
තම්බපන්නියේ උණුහුම පරපුරකට කියා දෙන්ට
සාදු සාදු මට අවසර මේ වෙරළේ බිජුදාන්ට
පිංවතුනේ පිහිය අරන් ඇයි ආවේ මං බලන්ට

හිච්චි පුතේ පිහිය ගනිං මේං කකුල කපාගනින්
හීන් කොලුවො පිහිය ගනිං මේ කකුලත් කපාගනින්
කළුමල්ලියෙ පිහිය ගනිං තුන්වැන්නත් කපාගනින්
සුදු මල්ලියෙ පිහිය ගනිං සිව්වැන්නත් කපාගනින්

සඳකඩ පහණක උලලා මුවත් තිව්ව පිහිතලේද
නටබුන් පිළිමෙක උලලා මුවත් තිව්ව පිහිතලේද
සණ්ඨා කුලුනක උලලා මුවත් තිව්ව පිහිතලේද
පූජාසනයක උලලා මුවත් තිව්ව පිහිතලේද

හෝඩිපොතේ පිටු කඩලා එක් කකුලක් ඔතාගන්ට
සුභාෂිතේ පිටු කඩලා තව කකුලක් ඔතාගන්ට
ලෝවැඩ සඟරාව කඩා තුන්වැන්නත් ඔතාගන්ට
ඉතිහාසේ පිටු ඉරලා සිව්වැන්නත් ඔතාගන්ට

සංස්කෘතිය කබල් ගෑව හට්ටියටම මස් දාන්ට
මිරිස්තුනපහේ එක්කම අනන්‍යතාවය අනන්ට
අම්මා දුන් කිරට වැඳලා පොල් ගෙඩියක කිරි දාන්ට
හතරවරම් දෙවිපිහිටයි කට ගැස්මේ රහ බලන්ට

අත්ත මුත්ත කිරි කිත්තන් සොහොනින් නැඟිටින්න එපා
අම්මා අප්පා අඹු දරුවන් කිසිවෙකු දැන ගන්ට එපා
යක්ෂ භූත පිශාචයන් කිසිවෙකු දැන ගන්ට එපා
මෙතේ බුදුන් හමුවනදා දෙකකුල් පැටලෙන්න එපා

කුමාර හෙට්ටිආරච්චි

## *Distant Roses!*

*Once again,*
*Russell Square!*
*Spring Roses*
*An old couple*
*An old couple*
*Walk slowly, peacefully and gracefully*
*Suddenly the man - the old man*
*Stops by the Roses,*
*[I too passed by them*
*A short while ago*
*But did not pause]*
*He bends, stretches out a shaky hand*
*And touches - gently,*
*The largest flower in the bunch*
*Then he sniffs it*
*[Probably feeling the scent]*
*The old woman,*
*his companion*
*Awaits nonchalant,*

*Still glued to the majestic Elm*
*Bewildered I watch*
*The shaky hand,*
*The bright yellow Roses, and*
*The old woman unperturbed.*

**Professor**
**Udaya Prasanta Meddegama**
**University of Peradeniya**

# මායිමේ එකී මං සෝමවතී

දිඹුලාගල කන්දේ පන්සලේ
විසි අට වැනිදා හීලට
වැව් මාලුවක් හොයාගෙන
බතක් මැල්ලුමක් හදාගෙන
දං මුරේ නොවරදවා
පන්සලට පුදන
සෝමවතී මං

මනම්පිටියේ පාලම පල්ලේ
ඩිස්පැන්සරියේ ක්ලිනික්දාට
බඩදරු හේමලතා තියාගෙන
වේවැල් මිටියකුත් බැඳගෙන
හැතැප්ම ගානක් බයිසිකල් පදින
අරලගංවිල මායිමේ
සෝමවතී මං

හැන්දෑවේ පැල් රකින්න ගිය
රාමචන්ද්‍රන් අතුරුදහන් වූ උදේ
අම්මාට පුතා හොයා දෙන්න
දුලාට අප්පා හොයා දෙන්න

වැලිකන්දේ කැම්ප් එකේ
ගේට්ටුවේ බලා හිටි
සෝමාවතී මං

බෝගයක් පල නොදරන කාස්ටකේ
හැපි හැපී අව් කුටකේ වියැලෙන
බඩ ඉරිඟු ඩිංගක් පලාවක්
මයියොක්කා දණ්ඩක් හිටෝ ගන්න
උකුලෙන් වතුර ගේන
නල ළිඳට හූල්ලන
සෝමාවතී මං

පල්ලිගොඩැල්ලට කොටි ආ
රාත්තිරියේ
ඇඳිවත පිටින් කැලෑ වැදි උන්ට
හාල් තුනපහ හොයාදෙන්න
සරමක් චීත්තයක් ඉල්ලාදෙන්න
කොළඹටම ගැටු හිඟන්නී
අතේ සතේ නැති
සෝමවතී මං

අබලන් බිල්ඩිං දෙකතුනක
වපසරියේ
දෙසිය හැත්තෑවකගේ
ගුරුකමට
විදුහල්පති පමණක්ම පත්කළ
මායිම් ගමේ එකම ඉස්කෝලේ
ස්වේච්ඡාවෙන්ම ගුරුකම
කරන
ඕ ලෙවල් යන්තම් පාස්
සෝමවතී මං

අප්පා මහේෂ්වරන්
යෝගරාජන්ට ආව
අම්මා සීලවතී මදුරපෙරුමට
උපන්
ලොකු දූ සෝමවතී මං
උන්ගෙ තර්ජනයටත්
මුන්ගෙ සැකයටත්
හැමදාම මැදිවුනු මායිමේ එකී
සෝමවතී යෝගරාජන් මං

අනෝමා රාජකරුණා

## *Somebody.....*

Somebody came into my dreams,
And left a thousand memories.
Somebody became mine,
And left me the waiting.
Somebody is far from me today,
But very close to my heart.
Somebody became a stranger to me,
But left me the Love of a thousand years.
Now the morning beauty is gone,
And the night of loneliness begins.
Somebody got close to me,
And my life completely changed.
Somebody left me to the bitter seasons
And left me the, memories of spring
Somebody made promises to me,
And left me with a broken heart.
Somebody came into my dreams,
And left a thousand memories.
That somebody was TRUE LOVE
Which never left the heart
with all those changes.....

**Inoka A Balasuriya**

## සමු ගනිමු

ඒ - ශනි දිනයි
නිලඹරේ විහඟුන් කෑදලි කරා ඉගිල යෙති.
මෙම හෝරාව රාත්‍රියේ ළඟාව දනවයි.
ගුරු බැති පිදුම සඳහා දරුවන් ගොනු වූයේ
එක ම තිත්පලකටය.
පරිසරයේ සිසිල් බව ගත සිත පුබුදු කරවී
ආ ගිය කතාවලින් සපිරුණු මේ හමුව
ජීවිතයේ අමතක නොවන සටහනෙහි
රස මසවුලෙන් පිරි බොජුන කාගේත් මන පිනවී
හෝරා කිහිපයක් ගත වුව ද
දුරු කතර ගෙවා ආ දරුවනට
ආපසු යා යුතු බවෙහි හැඟුමෙක් නැත.
හමුව නිම වූයේ අහස් කුස බබලන ඈත
යන පැතුමෙනි
දැන් අප සමුගත යුතුව ඇත.
අද අප ඔබෙන් සමුගත්තත්
කොහේ හෝ තැනෙක
ඔබ - අප හමුවනු ඇත.

කොල්වින් දිසානායක

# අටලෝ දහම

චන්දන ෆොන්සේකා
ලන්ඩන් නුවරදී



වසරක් ගෙවී තව වසරක් එළඹෙනවා
සිතුවිලි පොදිබැඳන් දිගු ගමනක් යනවා
දවසින් දවස අප සැම වයසට යනවා
ඒ ගැන සිතෙන විට මගෙ සිත දුක්වෙනවා

මෙලොව එළිය දැක්කා එක් දිනයකදි
මිහිපිට පයද තැබුවා තව දිනයකදි
සොදුරු ළමා ලොව ගෙවුනා දිනයකදි
පැහැබර යොවුන් විය ලැබුවා දිනයකදි

මෙලෙසින් සසර තරණය කරනා කලට
සහකාරියකගේ අඩුවක් දැනුන මට
පතාගෙන පැමිණි ඇය මට ලැබුණු විට
කැන්දාගෙන ගියා මනරම් නගරයට

මව් පදවියට ඇය හිමිකම් කියු දිනේ
නිම්නැති සතුට හදවත් තුළ පිරිගියේ
කිරිකැටි බිළිඳුකුගේ හඬ මට ඇසුදිනේ
දෝරේ ගැළු දරුසෙසෙහස හදමඩලේ

මතුයම් දිනක අප සැම දෙන මියැදෙනවා
එනමුදු තවත් දිනයක අප ඉපැදෙනවා
විශ්වය වටා අප දිගු ගමනක් යනවා
අටලෝ දහම එය බව සිහිපත් වෙනවා

## මේ නුවර ......... ට

යුක්තියේ අරුණලු
කවර කල උදා වේවි ද
මෙනුවරට?

පර ගැතියන් දවාලු
දේශ හිතෛෂීන්
යලි නොඉපදුනු වේ දෙරණේ
මංමුලා වී අතරමං වී,
අඳුරෙහි සැරි සරන්නෙමු

යුක්තිය වෙනුවෙන් සටන් වදින
දිනෙන් දින තැලෙනා,
වද වේදනා විදිනා, මියැදිනා
සොහොයුරු කැළ මෙනෙහි වෙමිනා
දින දින මැරි මැරි උපදිනා
කෙසේ පණ ණල රැක ගනිම් දැයි
හද තුළ කුකුසක් නලියනා!

සථ පිළි සපයන්නෙත්,
පැන් වඩවන්නෙත්
මල බෙර වයන්නෙත්
පෙරහැරේ ගමන් කරන්නෙත්
අප අතරින් එකෙකුන් විය හැක!

මෙම දසුන් දකිනා
නිහඬව සෝ සුසුම් හෙළනා
දිවා රෑ නිදි වරනා
මම ද ඔබ අතරින් එකෙකු විනා!
වෙන අන් කව්රුත් නෙවනා!

පණ නල රැකුමට
වෙර දරණුන්හට
තලා පෙලන්නට
සිත් පිත් නැතුවද
සොහොයුරියනි ඔබ හට?

වැනසූ නටඹුන් නගරයක
මතු වන ඇට සැකිලි මත
දිවි ඔසු පතිත කළ පමණින්
උන් අහිමි කළ ඒ ජීවයන්
යළි පණ පොවන්නට හැකි
ජීවකයෙකු
බිහි වේවිද මෙනුවරට?

සුනු විසුණු කරවූ
පර ගැතියන් වැටලූ
නරුම නගරයක
කිමද නිදහසක අරුම?
යුක්තියේ අරුණලු
කවර කලද?
උදා වේවිද මෙනුවරට?

සෙයිද් ෆිර්දවුස්බ් හනීෆ්ඩීන්

මහත් තුරු
සොරකම් කරති
කුඩාවුන්ගේ සරුංගල්

වල් ඇහැළ ගස වත්තේ
හදා ගත්ත ද ආදරයෙන්
රැක බලා ගත්ත ද පෙමින්
උගන්වා ගුණ දම්
සොරකම් කරගෙනය
සරුංගලයක්
ඒහා වත්තේ පොඩි එකෙකුගේ
නමටම ගැළපෙන වල් කමකි
එය

පුංචි සිහිනයක් ද
කැඩී නූලෙන්
පාවී ආ බලාපොරොත්තුවක් ද
ලද ලියකයේ

චමත්කාරය
සරුංගල් උපමා
ඉඳහිට කවියෙහි හමුවන

වළාකුල් දියවෙලා
බේරෙන්න ළඟ නිසා
සොයා ආවොත් පොඩි එකා
දෙන්නෙමැයි
රීටක පටලවා
ගලවාගත් සරුංගලයේ

තවමත් ඇත
පොඩි නොවී වේළුණු බත් ඇට
ඇක්සයිස් පොතකින්
කපාගත් රැළි

ලාල් හැගොඩ

# කඳුළු වැටුණු මල්

හද තුළ දුක් උල් නැඟිට සිටිද්දී
බස් රිය තුළ මොට දිරි හිඳුවාගෙන
කඳුළු එපා වූ නෙත'ගිසි පිසිමින්
බිරියට මල් ගෙන යන එක් මිනිසෙකි.

නපුරු රැයක් ඔහුගේ සිත් අඹරෙහි
සඳ හා තරු රැස හප කොට ගිලි ගෙන

මල් ගෙන යන්නේ බිරිය නිඳන තැන
අරලිය තුරු යට මිටි කොත අසලට.
තුන් වැනියෙකු නිවෙසට ගෙන එන්නට
උදැසනක ගිය සඳ වැනි දෙවැනි ය
පළවැනියා හදට ද ගිනි ගස්වා
තුන් වැනියා හා ඇවුණි ය සුදු හැඳ.

එ'ගිනි තව ම නොනිවී ඇති හද මස
පැළැහී අළු වී මුත් දවටා ගෙන,
ඇගේ ලොවට නො පමා ව ම යන බව
කොඳුරමිනු යි, කල් ගෙවුණේ නිතොර ව.

එබඳු තවත් සිතුවිලි ලෝකෙක සිට
රුවක ඇනී නෙත පියවි සතිය ලැබ
බස් රථයට පිවිසෙන ගැබිනියකට
අසුන පුදන්නෙ ය ඒ දුක්බර රුව.

තමනට අහිමිව ගිය ලෝකයකට
නැඟිට මෑත් වී ඉඩ සලසන විට
ඔහු අත මල් පැස තුළ මල්
පෙත්තක
පුදුමෙකි! පිනි බිඳුවකි ඒ දහවල.

ලක්ශාන්ත අතුකෝරල

## අකුරු කරන්නට ඇවිදින්

අම්මේ
හඬලන උදැසනක් මෙහි නෑ
සැව්ළිඳු
බෙලි කපා එල්ලලා කොක්කේ

සියලු දහ ජරාව
පාකර හරින කානුවේ
වක්කඩක් කොහිද මෙහි

රා බීපු
චණ්ඩි අලි පිඹ ගෙන යනවා
ඩීසල් දුම් අතුල් පාරවල් ගහගෙන

මහ උයන වටා කටු කම්බි ගසා ඇත
තම තමන්
තම තමන් ගේ
සතුට සලසා ගත යුතුය

කොත්තුයි කියන
පුදුම කෑමක් තියෙනවා මෙහි
ඔට්ටුයි අම්මා නොකා විසිකරනවා

මීටර් සීයේ ධාවන වේගය
ගන්නට හිතෙනවා දෙපයට
මෙහි එන්න එපා අම්මේ
මං ගෙදර එනවා විගසින්

රොෂාන්ති කරුණාරත්න
රත්නපුර

ලන්ඩන් කවි
LONDON KAVI

## පද්මාවතී

පද්මාවතී පද්මාසනේ
පාසලේ සරසවි දේවියේ
ඒ දණ්ඩ ළඟ ඇළ කණ්ඩියේ
තිස් වසරකට පසු හමු වුණේ

සල්පෙති වගේ කම්මුල් පුරා
තව රෝස පවුඩර් තවරලා
නුඹේ නළල මත තිලකය තබා
දෙතොල රතු පෑ ගන්වලා

දිගු වරලසත් මල් වැල් ඔතා
දෙපා ගිගිරෙන් සරසලා
සුදු නයිලෝන් සාරිය පුරා
රන්පාට සැරසිලි අලවලා

නෙලුම් මල මැද හිඳුවලා
වීණාව උකුළෙහි රඳවලා
අපි හය දෙනෙක් පිරිවර එදා
නුඹේ පාද වැඳ පැදකුණු කළා

බෙර තාලයට මට වැරදුණා
නුඹ ඇස් ගසා ඉඟියක් කළා
මගේ පහන් සිළ නිවුණා කියා
මුව අයා ගෙන නුඹ දුක් වුණා
සරසවිය ලෙන්ගතු වී එදා
ඉගිලුණු බොහෝ දෙන තනිවෙලා
නුඹ අදත් ඒ සරසවිය මැයි
මැටි ගෙපිල මව් ආසන අරා

සමුගැනුම ළඟදී වැරදිලා
මගෙ හිස නැමෙන්නට සැරසුණා
පද්මාවතී! නුඹ හිනැහුණා.

සුධර්මා සුභාෂිණී

## ගෙම්දුලට ආ අමුත්තා

අවුරුදු 60,000කට පසු අඟහරු
ග්‍රහයා පෘථිවියට ඉතාමත් ළං ව
පිහිටීමේ විරල අවස්ථාවේ උදාවේ.
(2003 අගෝස්තු) - පුවතක්

ගල් ලෙනෙන් පිටත
අඳුරු වන වදුල යට
ගිනි මැලය
පට පට ගා ඇවිලෙන

මස් පලහා කා
ගල්තලා යහනත වැතිර
පැතිරුණු අහසෙ සිට
ඔබ .......
වගුළ රැස් කදම්භයෙන්
සිත් සේ නැහැවුණෙමි එදා
සීමා ඉම් නැති ගෙම්දුකලට ව


බොහෝ කලකට පසුවයි
යළිදු මේ හමුවීම

ගිනිකොණට
නැගෙනහිරට බර ව
සය ගුණයකින් විශාල ව
තුරුණු රශ්මියෙන් පිරිපුන් ව
එදා වාගේ ම යි අදත් ඔබ
පැතිරුණු අහසකට ව

ගොනු කෙරූ
දත්ත රැසක් ඇත අද
ඔබ නමට
ගෙනා පස් අංගු ද තිබෙයි
පිරික්සීමට

වෙහෙසකර ඇස තබා
දුරේක්ෂය මානම්
දුක් සේ කොටු කරගත්
කුඩා ගෙම්දුලකට ව.

උදේනි සිරිමාන්න



*අබා චිත්‍රපටියේ ගීත*

රාං රාං රාං රාං රාං රාං රාං
හීං හීං හීං හීං හීං හීං හීං
මාං මාං මාං මාං මාං මාං මාං
ඕං ඕං ඕං ඕං ඕං ඕං ඕං

රාං රුවැති දිය රැළි ගෙල ලා ලා ලා
හීං සැරේ දියේ කිමිද නා නා නා
මාං සියට දිය කෙළින්ඩ හා හා හා
ඕං යාළු වරෝ හිනා පා පා පා

මල් තුරු සරසන්ඩයි
පැණි වන බමරුන්ඩයි
විල් දිය මාළුන්ඩයි
රට විරු දරුවන්ඩයි

හැංගෙමු ගස් බෙනයේ
නිදියමු නයි පෙනයේ
කෙළි කෙළ මහ වනයේ
රජ වෙමු හෙට දිනයේ

රුපු සෙන් බලය ඔබා
යමු යන ගමන නොබා
සිංහාසනේ තබා
රට පිළිගනී අබා

පද රචනය : මහාචාර්ය සුනිල් ආරියරත්න

## මතක වස්තුව

මා හැර දා
දරුදඬු කොට දා මා අත් පා
ඈ යන්න ගියා මැකිලා
ඈ යන්න ගියා
සැමරුම් වග වලසුන් රෑනට
මා ගොදුරක් වී
ලේ ගලනා ගොදුරක් වී,

කාලයෙ ගන අඳුරින් වැසුනත්
සෙලවෙන හදවත පහනෙහි සිලුවෙන්
ඈ ගත දිලිසෙයි
දෑසට දිස වෙයි

ගෙරහැඬි ගල්ගෙඩි අතරින්
ඈ
සීතල දියර ඉරක් සේ
ගලා බසී
හද තෙමා බසී

පිරිසිදු අහසෙහි පැහැය ඇගෙයි
ගස්වල මල්වල පැහැය ඇගෙයි
මුලු ලෝකෙ ම හැම පැහැය ඇගෙයි

කොතෙකුත් දැඟලුවත් සැඟවෙන්නට
ඇසිපිය දැල්වල මයි ඇය දැවටුම
අමතක භාවයෙ අන්ධකාරයේ
දෙබෑ කරන් වේලුන ගන හම
එබී බලයි සොඳුරිය ඔබ ඇස් දෙක
තොල් දෙක සෙලවුම තවම පෙනෙනවා
හීන් සැරේ මා වැලඳ ගන්නවා

ජීවිතයට ඇති එක ම සොඳුරු බව
ලෝකයට ම ඇති රූමත් එක දෙය
ඈ මයි තනිවට හිටි එක ගැහැනිය
මැකී ගියත් තනිවට හිටි ගැහැනිය

මහාචාර්ය සිරි ගුනසිංහ

# හබරා ගීතය

හබර හබර හබර හබේ
හබර හබර හබර හබේ
ගුම්බුකබූතංග ගුම්බුක බූතේ
ගුම්බුකබූතංග ගුම්බුක බූතේ

මේ කවි මසුරං හොඳ හැටි අහගං
මේ කවි මසුරං හොඳ හැටි අහගං
එකමත් එක කාලෙක අප දේසෙට
කුමරෙක් ආවා වංග රටේ සිට

විජය තමයි ඒ නිරිඳුගෙ නාමය
ඔහුට හිටිය සෝයුරා සුමිත්තය

සුමිත්තගේ පුතු පඬුවස් දේවය
දැන් රට හිමි ඒ රජ්ජුරුවන්ඩය

හද්‍රාකච්චායනා කුමාරි
පඬුවස්දෙව් රජ මෙහේසිකාවි
කුමාරවරු දස දෙනෙක් වාදායී
එකොළොස් වැන්නී චිත්‍රා දෝණී

කුමාරයෙක් ලැබුණොත් චිත්‍රාවට
මාරක අපලයි මාමා වරුණට
එබැවින් ඇය ලා එක්ටැම් ගේකට
චිත්තරාජ යෙද වී මුර සේවෙට

දීඝගාමිණී කුමරුගෙ නාමෙට
කුමාරයෙක් ලැබුණයි චිත්‍රාවට
දස මාමාවරු එද්දී වැඳුම් ගෙට
කුමාරියකි සිටියේ චිත්‍රා ළඟ

රජ පෙළපතකට බඳින්ඩ සේතුව
පඬු රජ බවනේ නගන්ඩ කේතුව
සැඟව සිටි ඒ යක් ලේ ධාතුව
විපතක් උණොතින් රටේ අහේතුව

පද රචනය :
මහාචාර්ය සුනිල් ආරියරත්න